අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"இசுருபாய", பத்தரமுல்லை, இலங்கை.
"Isurupaya", Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref: ED3/37/01/133

ඔබේ අංකය / உமது இல. / Your Ref:

දිනය / திகதி / Date: 2020 ජනවාරි 01

චක්‍රලේඛ අංක: 03/2020

උපදෙස් හා මාර්ගෝපදේශ අංක: 01

සියලුම: පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 ක් දක්වා ඉහළ නැංවීම**

**හා**

**අංගසම්පූර්ණ ත්‍රෛභාෂා ද්විතියික ජාතික පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම**

**සහ**

**එම පාසල් සම්බන්ධ කරමින් කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් (school network) ස්ථාපිත කිරීම.**

## 1.0 හැඳින්වීම

සෑම පාසල් සිසුවකුටම සම-සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ලබාදීමත්, ගුණාත්මක අධ්‍යාපන අවස්ථා ලබාදීමත් අධ්‍යාපනයේ ප්‍රමුඛ අරමුණකි. "සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තියෙහි "ඵලදායි පුරවැසියන් සහ සතුටින් ජීවත්වන පවුලක්" තේමාව යටතේ "පාසල් අධ්‍යාපනයේ නවෝදය" වැඩසටහනෙහි ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්තිමය යෝජනා වල අධ්‍යාපනය සම්බන්ධයෙන් වන රාජ්‍ය දායකත්වය පැහැදිලි ව ප්‍රකාශයට පත් කර ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් පද්ධතිය විධිමත් කිරීමේ වැඩසටහනට පහත සඳහන් ප්‍රමුඛ වැඩසටහන් ඇතුළත් වේ.

- පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා ඉහළ නැංවීම.
- සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි අංගසම්පූර්ණ ත්‍රෛභාෂා ද්විතියික ජාතික පාසල් 20ක් ස්ථාපිත කිරීම.
- උක්ත පාසල් ගොනු කෙරෙමින් කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් (school network) ස්ථාපිත කිරීම.

## 2.0 අරමුණු

- නිදහස් හා අනිවාර්ය අධ්‍යාපන අයිතිය ප්‍රශස්ත ලෙස තහවුරු වන පරිදි සියලු දරුවන්ට සම-සාධාරණ හා උසස් මට්ටමේ අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගීත්ව අවස්ථා සහතික කරලීම.
- ද්විතියික අධ්‍යාපන විෂයධාරාවන් ක්‍රියාත්මක කරනු ලබන පාසල්, විධිමත් කිරීම මඟින් ප්‍රශස්ත මට්ටමින් සම්පත් උපයෝජනය සහතික කරලීම.
- මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලබන පාසල්වලින් ආවරණය නොවන පාසල් සම්බන්ධයෙන් සිරස් සම-සාධාරණත්ව ප්‍රතිපත්තිය (vertical equity) තහවුරු වන පරිදි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමස්ත අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම (learning outcomes) ඉහළ නැංවීම.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary: +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

## 3.0 අපේක්ෂිත නිමැවුම් (outputs) හා ප්‍රතිදාන (outcomes)

(අ) අපේක්ෂිත නිමැවුම් (outputs):

- දැනට පවතින ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා ඉහළ නැංවීම.
- වැඩසටහන සඳහා තෝරා ගනු ලබන පාසල්වල භෞතික, යටිතල හා මානව සම්පත් සංවර්ධනය.
- සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි අංගසම්පූර්ණ ත්‍රෛභාෂා ද්විතියික ජාතික පාසල් 20ක් ස්ථාපිත කිරීම.
- සමස්ත පාසල් පද්ධතිය ම ගොනුගත වන පරිදි කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් (school network) ස්ථාපිත කිරීම.

(ආ) අපේක්ෂිත ප්‍රතිදාන (outcomes):

- කිසිදු භේදයකින් තොරව සියලුම පාසල් දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගීත්ව අවස්ථා තහවුරු කර තිබීම.
- දැනට පාසල් පද්ධතිය තුළ සිදු වී ඇති ද්විධ්‍රැවීකරණය (bi-polarization) අවම වී තිබීම.
- අධ්‍යාපන පද්ධතියේ දැනට පවතින සම්පත් බෙදා හැරීමේ විෂමතාව අවම වී තිබීම හා අධ්‍යාපන ආයෝජනයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවී තිබීම.
- ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සමස්ත පද්ධතිය ආවරණය වන පරිදි ලබා දීමට හැකි වී තිබීම.
- සමබර ප්‍රාදේශීය සංවර්ධනයක් (balanced-regional development) තිරසාරව පවත්වාගෙන යාමට හැකි වී තිබීම.
- අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවී තිබීම.

## 4.0 ක්‍රමවේදය:

### 4.1 පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000ක් ලෙස ඉහළ නැංවීම

මෙම වැඩසටහන අධ්‍යාපන සැලසුම්කරණ ක්‍රමවේද යටතේ විද්‍යාත්මක සිද්ධාන්ත මත පදනම්ව ක්‍රියාත්මක වේ. පාසල් විධිමත් කිරීම (school rationalization) හා පාසල් සිතියම්කරණ (school mapping) අභ්‍යාසයන් හරහා එම ක්‍රියාවලිය පහත සඳහන් පියවරයන් යටතේ ක්‍රියාත්මක වේ.

පියවර 1: කේන්ද්‍රීය පාසල් හා එම කේන්ද්‍රීය පාසලට ගොනුගත වන පාසල් ජාලය (school network) හඳුනාගැනීම.

පියවර 2: සංවර්ධනය සඳහා පාසල් ජාල තෝරා ගැනීම තහවුරු කිරීම.

පියවර 3: පාසල් සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම (දිගු කාලීන, මධ්‍ය කාලීන හා කෙටි කාලීන) හා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

පියවර 4: තෝරා ගත් පාසල්, ආදර්ශ, කාර්යක්ෂම, පිරිවැය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථාන (model, efficient, cost & resource management centers) ලෙස ක්‍රියාත්මක කිරීම.

පියවර 5: නියාමනය, ඇගයීම හා ප්‍රතිඵල ඇගයීම (impact evaluation).

පියවර 1: කේන්ද්‍රීය පාසල් හා එම කේන්ද්‍රීය පාසලට පෝෂණය වන පාසල් ජාලය (school network) හඳුනාගැනීම.

කේන්ද්‍රීය පාසල් හා එම කේන්ද්‍රීය පාසලට පෝෂණය වන පාසල් ජාලය (school network) හඳුනාගැනීම පාසල් සිතියම්කරණ (school mapping) තාක්ෂණික ක්‍රමවේදය හරහා ක්‍රියාත්මක කෙරේ. මෙහි දී කේන්ද්‍රීය පාසල් හඳුනාගැනීම අදියර දෙකක් (02) යටතේ සිදු කළ යුතු ය.

අදියර 1: මෙහි දී දැනට ජාතික පාසලක් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු ය.

අදියර 2: දැනට ජාතික පාසල් පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා කේන්ද්‍රීය පාසල් තෝරා ගැනීම කළ යුතු ය.

හඳුනා ගනු ලබන පාසල් ජාලයෙහි කේන්ද්‍රීය පාසල් හඳුනාගැනීමේ දී පහත සඳහන් සාධක/නිර්ණායක අනුව පාසල් හඳුනාගැනීම සිදු කළ යුතු ය.

i. අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා හා සහභාගීත්වය (access in and participation for education).
ii. ශිෂ්‍ය ගලනය (student flow).
iii. යටිතල පහසුකම් පුළුල් කිරීමේශක්‍යතාව (feasibility of expansion of infrastructure facilities).
iv. අපොස උසස් පෙළ ශිෂ්‍ය ගලනය හා ශිෂ්‍ය ජනගහනය (GCE AL student flow).
v. ත්‍රෛභාෂා මාධ්‍ය ඉගෙනුම් සඳහා පහසුකම් (possibility to trilingualism).
vi. සමාජ-ආර්ථික සාධක (socio-economic factors).
vii. පාසල් ජාලයට අයත් වන ප්‍රාථමික හා ද්විතියික පාසල්වල ශිෂ්‍ය ජනගහනය (3 වර්ගයේ හා 2 වර්ගයේ) [(student population in primary and secondary schools in the school network) (Type 2 & Type 3)].
viii. පාසල් ජාලය තුළ තිබිය යුතු පාසල් සංඛ්‍යාව (number of schools per network).
ix. ප්‍රධාන කේන්ද්‍රීය පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාව (school size of the core school in the network).
x. ප්‍රධාන කේන්ද්‍රීය පාසල සඳහා දැනටමත් සිදුකර ඇති රාජ්‍ය ආයෝජන (කුමන කරුණු අරභයාද/මූල්‍ය ආයෝජන රුපියල් මිලියන කොපමණ ද යන්න සහිතව) (public investment for the core school of the network).

**i. අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා හා සහභාගීත්වය (access in and participation for education)**

- සංවර්ධනය සඳහා තෝරා ගනු ලබන කේන්ද්‍රීය පාසල්වල ශිෂ්‍ය ප්‍රවේශය හා සහභාගීත්වය පිළිබඳ ව තහවුරුවක් තිබිය යුතු ය. කේන්ද්‍රීය පාසල් හඳුනාගැනීමේ දී සිසුන් ප්‍රමුඛ සාධකය වේ. කිසිදු දරුවකුට ඉගෙනුම් අවස්ථා අහිමි නොවන අයුරින් කටයුතු කළ යුතු ය.

- සිසුන්ට කිසිදු භූගෝලීය, සමාජ-ආර්ථික හා වෙනත් කිසිදු අගතිගාමී බවක් ඇති නොවන අයුරින් සෑම දරුවකුටම අධ්‍යාපනය සඳහා ඇති අයිතිය තහවුරු විය යුතු ය.

**ii. ශිෂ්‍ය ගලනය (student flow)**

- පසුගිය වසර 5ක කාලසීමාව තුළ හඳුනාගන්නා පාසල් ජාලය තුළ ඒ ඒ පාසල්වලට ඇති ශිෂ්‍ය ඉල්ලුම විශ්ලේෂණය කළ යුතු ය. එම විශ්ලේෂණය පාසල් වශයෙන්, ශ්‍රේණි වශයෙන්, විෂය ධාරා වශයෙන් කළ යුතු ය.

- පාසල් ජාලය තුළ ඒ ඒ පාසලට සිසුන් පැමිණීම ගණනය කිරීමේ දී ග්‍රාමසේවා නිලධාරි වසම වශයෙන් එම ගණනය සිදු කළ හැකිය. ඒ සඳහා පහත සඳහන් ආකෘති පත්‍ර භාවිතා කළ හැකි ය.

- ආකෘති පත්‍ර 1: Student flow by student information
- ආකෘති පත්‍ර 2: Student flow by grades
- ආකෘති පත්‍ර 3a: Student flow by schools (number of students from each GN division)
- ආකෘති පත්‍ර 3b: Student flow by GN division (example)
- ආකෘති පත්‍ර 4: Student flow by school and by grade
- ආකෘති පත්‍ර 5: Format for submission of school list with structure proposals

iii. යටිතල පහසුකම් පුළුල් කිරීමේ ශක්‍යතාව (feasibility of expansion of infrastructure facilities)

- හඳුනාගනු ලබන කේන්ද්‍රීය පාසල, ඉදිරි සංවර්ධනාත්මක පහසුකම් එනම් සමස්ත පාසල් ඉගෙනුම් පරිසරය ආකර්ශනීය අයුරින් ඉහළ නැංවීමට හා ඊට අදාළ යටිතල පහසුකම් හා අනෙකුත් භෞතික පහසුකම් සැපයීමට ඉඩකඩ ප්‍රමාණවත් ව තිබිය යුතු ය.
- එම පාසලෙහි විද්‍යාගාර පහසුකම්, අනෙකුත් විෂයානුබද්ධ උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ, ක්‍රීඩා පහසුකම්, අධ්‍යයනය පහසුකම් සඳහා ඉඩකඩ, විෂයබාහිර ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ ආදී පහසුකම් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතු ය.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් සහතික කරන ලද අවදානම් රහිත භූමියක කේන්ද්‍රීය පාසල පිහිටා තිබිය යුතු ය.

iv. **අපොස උසස් පෙළ ශිෂ්‍ය ගලනය හා ශිෂ්‍ය ජනගහනය (GCE AL student flows student population)**

- **ඉතා සීමිත සිසුන් සංඛ්‍යාවක් සඳහා අපොස උසස් පෙළ විෂයධාරාවන් පවත්වාගෙන යාම මඟින් අධ්‍යාපන සම්පත් යෙදවීම ඵලදායී නොවන බැව් නිරීක්ෂණය වේ. විශේෂයෙන් අපොස උ.පෙළ විද්‍යා විෂයධාරාව සඳහා සිසුන් 5 දෙනෙකුට වඩා අඩුවෙන් සිටිය ද, එම පාසල්වලට සියලුම පහසුකම් සැපයීමට සිදු වේ. එම තත්වය ඉගෙනුම හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ද සෘජුවම බලපෑනු ලබයි. එබැවින් අපොස උපෙළ විෂයධාරාවන් සඳහා ප්‍රමාණවත් සිසුන් සහිත පාසල් හඳුනාගෙන අපොස උපෙළ විෂයධාරා ක්‍රියාත්මක වන පාසල් විචාරවත් කළ යුතු ය (උදා: අපොස උපෙළ: විද්‍යා විෂයධාරා සහිත පාසල්, සෞන්දර්ය විෂයධාරා සහිත පාසල්, තාක්ෂණික විෂයධාරා සහිත පාසල්, කලා විෂයධාරා සහිත පාසල්, වාණිජ විෂයධාරා සහිත පාසල් ආදී වශයෙන්).**

v. **ත්‍රෛභාෂා මාධ්‍ය ඉගෙනුම් සඳහා පහසුකම් (possiblity to trilingualism)**

- **මෙම වැඩසටහනට තෝරා ගනු ලබන කේන්ද්‍රීය පාසල්වල ත්‍රෛභාෂා මාධ්‍ය ඉගෙනුම් සඳහා අවශ්‍ය සියලුම පහසුකම් සැලසීමට හැකියාව තිබිය යුතු ය.**

vi. **සමාජ-ආර්ථික සාධක (socio-economic factors)**

- **ඒ ඒ ප්‍රදේශවල පවත්නා ඇතැම් සුවිශේෂී සමාජ-ආර්ථික සාධක සලකා බැලිය යුතු ය. එවන් සුවිශේෂී තත්වයන් මත සිසිදු දරුවෙකුට අධ්‍යාපනය සඳහා බාධාවන් ඇති නොවිය යුතු ය.**

vii. පාසල් ජාලයට අයත් වන ප්‍රාථමික හා ද්විතියික පාසල්වල ශිෂ්‍ය ජනගහනය (3 වර්ගයේ හා 2 වර්ගයේ) [(student population in primary and secondary schools in the school network) (Type 2 & Type 3)]

- සමස්ත පාසල් ජාලය සඳහා හඳුනාගෙන ඇති පාසල් වල ශිෂ්‍ය ජනගහනය 1,000 - 3,000 අතර විම ප්‍රමාණවත් ය.

viii. පාසල් ජාලය තුළ තිබිය යුතු පාසල් සංඛ්‍යාව (number of schools per network)

- දළ වශයෙන් එක් පාසල් ජාලයක් සඳහා ගොනුගත වන සාමාජික පාසල් වලට උපරිම වශයෙන් පාසල් 5-8 ක් අතර සංඛ්‍යාවක් ඇතුළත් විය යුතු ය.
- සියලුම පාසල් කුමන හෝ ගොනුවකට (පාසල් කේන්ද්‍රයකට) ඇතුළත් විය යුතු ය.
- හුදකලා ලෙස හඳුනා ගනු ලබන පාසල් ද කුමන හෝ ගොනුවකට (පාසල් කේන්ද්‍රයකට) සම්බන්ධතාව සඳහා නම් කළ යුතු අතර, එම පාසල් හි සුවිශේෂ බව (හුදකලා) දක්වා තිබිය යුතු ය.
- දැනටමත් සංවර්ධනය වූ, අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් ද අදාළ ගොනුවේ (පාසල් කේන්ද්‍රයකට) සාමාජික පාසලක් ලෙස නම් කළ යුතු ය.

ix. ප්‍රධාන කේන්ද්‍රීය පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාව (school size of the core school in the network)

- කේන්ද්‍රීය පාසල 6-13 ශ්‍රේණි සහිත ද්විතියික පාසලක් විය යුතු ය.
- කේන්ද්‍රීය පාසලෙහි සිටිය යුතු අවම ශිෂ්‍ය සංඛ්‍යාව 750 ක් විය යුතු ය. අධික ශිෂ්‍ය ජනගහණයක් එක් පාසලකට ගොනු නොවන අයුරින් හා පාසල් ජාලයට අයත් පාසල්වල සිසුන්ට ප්‍රධාන කේන්ද්‍රීය පාසලට ප්‍රවේශය සඳහා ඇති ඉඩකඩ තහවුරු විය යුතු ය.

x. ප්‍රධාන කේන්ද්‍රීය පාසල සඳහා දැනටමත් සිදුකර ඇති රාජ්‍ය ආයෝජන (කුමන කරුණු අරභයාද / මූල්‍ය ආයෝජන රුපියල් මිලියන කොපමණද යන්න සහිතව) (public investment for the core school of the network)

- තෝරා ගනු ලබන කේන්ද්‍රීය පාසල සඳහා රජය විසින් පසුගිය කාල වකවානුවල විවිධ රාජ්‍ය හා සංවර්ධන පාර්ශ්ව ආයතන මෙන් ම විවිධ මූල්‍ය මූලාශ්‍ර හරහා සිදු කරන ලද ආයෝජනයන් සලකා බැලිය යුතු ය.

- එම ආයෝජනයන් හි උපරිම උපයෝජනය සිදුවන අයුරින් කටයුතු කළ යුතු ය.

පොදු පවිහත් :

- ඉහත නිර්ණායකවලට අනුකූලව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට පාසල් තුන බැගින් පාසල් හඳුනා ගත යුතු ය. සුවිශේෂී තත්වයන් වෙතොත් ඒ බැව් සාධාරණීයකරණය කළ යුතු වේ.

- පළාත් නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්) නිලධාරීන් 2020 ජනවාරි මස 15 දිනය වන විට තම පළාතේ ඉහත නිර්ණායකවලට අනුකූල ව මෙම වැඩසටහන යටතේ තෝරා ගන්නා පාසල් පළාත් අධ්‍යාපන බලධාරීන් (පළාත්, කලාප, කොට්ඨාශ) සමඟ තීරණය කොට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දිය යුතු ය.

- 2020 ජනවාරි මස සියලුම පළාත් අධ්‍යාපන බලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සමඟ මෙම වැඩසටහන යටතේ තෝරා ගනු ලබන පාසල් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. එහි දී පාසල්වල පවත්වනු ලබන අපොස උසස් පෙළ විෂයධාරා සම්බන්ධයෙන් ව්‍යුහාත්මක යෝජනා ද ඉදිරිපත් කළ යුතු ය.

පියවර 2: සංවර්ධනය සඳහා පාසල් ජාල තෝරා ගැනීම තහවුරු කිරීම

- ඒ ඒ පළාත විසින් යෝජනා කරනු ලබන පාසල් සම්බන්ධයෙන් තුන්වන පාර්ශ්ව ආයතනයක් මඟින් පළාත විසින් කරනු ලබන යෝජනා සම්බන්ධයෙන් ඇගයීමකට ලක් කර, තෝරා ගනු ලැබූ පාසල සංවර්ධනාත්මක ප්‍රවේශයක් සහිත පාසලක් බවට ශක්‍යතා නිර්දේශ ලබා ගැනීමට නියමිතය.

පියවර 3: පාසල් සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම (දිගු කාලීන, මධ්‍ය කාලීන හා කෙටි කාලීන) හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- මෙම පියවරේ දී පියලුම පාසල් පෙරළම් සැලසුම් ක්‍රමවේදය යටතේ පහත සඳහන් සැලසුම් පිළියෙල කළ යුතු ය.
    - මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම (2020 - 2025).
    - මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම මත පදනම් ව වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (වාර්ෂිකව පිළියෙල කළ යුතු ය).
- යෝජනා කරනු ලබන පාසල් ගොනුවෙන් (පාසල් ජාලය) ආවරණය නොවන පාසල්වල සිසුන් සඳහා, සිරස් සමසාධාරණ (vertical equity) මූලධර්මවලට අනුකූලව සුවිශේෂී සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු අතර, එම පාසල් සුවිශේෂී ලෙස සලකා භෞතික, මානව හා අනෙකුත් සම්පත් සපයා සංවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.
- පිරිවැය ඇතුළත් පාසල් සංවර්ධන සැලැස්ම අනුමත වීමෙන් පසුව මෙම වැඩසටහන එම පාසල්වල ක්‍රියාත්මක කළ යුතු ය.

සටහන:

- සැලසුම් පිළියෙල කිරීම, පිරිවැයකරණය හා සම්පත් පැකේජය (resource envelope) පිළිබඳ විස්තර ඉදිරියේ දී ලබා දීමට නියමිත ය.

පියවර 4: තෝරා ගත් කේන්ද්‍රීය පාසල් ආදර්ශ, කාර්යක්ෂම, පිරිවැය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථාන (model, efficient, cost & resource management centers) ලෙස ක්‍රියාත්මක කිරීම

- මෙම පාසල් සඳහා පාසල් සංවර්ධන සැලැස්මක් සකස් කර මෙම පාසල්වල පැබැ අවශ්‍යතාවන් ප්‍රමුඛතා පදනමින් හඳුනාගෙන භෞතික, මානව හා අනෙකුත් සම්පත් සපයා දීම හා මෙම, එක් එක් පාසල් සඳහා අයවැය ප්‍රතිපාදන වෙනම හඳුනාගෙන එම පාසල් ආදර්ශ, කාර්යක්ෂම, පිරිවැය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථාන (model, efficient, cost & resource management centers) ලෙස පවත්වා ගෙන යාමට යෝජිත ය.

පියවර 5: නියාමනය, ඇගයීම හා ප්‍රතිඵල ඇගයීම (impact evaluation)

- මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලබන පාසල්, විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව නියාමනය හා ඇගයීම සිදු කරනු ලැබේ.
- එසේම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ප්‍රතිදාන/ප්‍රතිඵල (impact evaluation) පිළිබඳ අධ්‍යයනයක් කිරීමට අපේක්ෂිත ය.

## 4.2 සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වන පරිදි අංග සම්පූර්ණ ත්‍රෛභාෂා ද්විතියික ජාතික පාසල් 20ක් ස්ථාපිත කිරීම

- මෙහි දී පහත සඳහන් නිර්ණායකවලට අනුකූල ව යෝජිත පාසල් ස්ථාපනය කිරීමට සුදුසු ප්‍රදේශයන් හඳුනා ගත යුතු ය.
    1. සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වීම.
    2. නව සංවර්ධනාත්මක කලාප, ජාතික සංවර්ධන නගර හා උපනගර ආශ්‍රිතව විශේෂයෙන් මෙම පාසල් ස්ථාපිත කිරීම.
    3. අධික ශිෂ්‍ය ඉල්ලුම හා අධික තරඟකාරීත්වය ඇති ප්‍රදේශවල මෙම පාසල් ස්ථාපිත කිරීම.

4. පිහිටවනු ලබන සියලුම පාසල් ද්විතීයික පාසල් (6-13ශ්‍රේණි) වන අතර මිශ්‍ර, ත්‍රෛභාෂා පාසල් ලෙස ක්‍රියාත්මක වීම.
5. අපොස උපෙළ සියලුම විෂයධාරාවන් පවත්වාගෙන යාම.
6. මෙම පාසල් සඳහා අවශ්‍ය සියලුම භෞතික, යටිතල හා මානව සම්පත් සැපයිය යුතු අතර, සියලුම පාසල් සඳහා සංවර්ධනාත්මක සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරනු ලබන අතර එම පාසල් ආදර්ශ, කාර්යක්ෂම, පිරිවැය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථාන (model, efficient, cost & resource management centers) ලෙස ක්‍රියාත්මක කිරීම.
7. ශිෂ්‍ය හා ගුරු නවෝත්පාදක මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම.

සටහන:

- මෙම පාසල් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වැඩිමනත් උපදෙස් ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිත ය.

4.3 උක්ත පාසල් වර්ග දෙක සම්බන්ධ කරමින් සෑම පාසලක් ම ආවරණය වන පරිදි කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් ස්ථාපිත කිරීම

- මෙම ජාල ස්ථාපිත කිරීමේ දී පහත සඳහන් සාධක පිළිබඳ ව සලකා බැලිය යුතු ය.
  - යෝජිත පාසල් ජාලය තුළ භෞතික හා මානව සම්පත් හුවමාරුව.
  - පාසල් ජාල-පාදක ව ගුරුවරුන් බඳවා ගැනීම.
  - සෑම පාසලක් ම කුමන හෝ පාසල් ජාලයකට අයත් වීම.
  - හුදකලා පාසල් ද පාසල් ජාලයකට අයත් වීම.
  - සෑම පාසල් ජාලයකට ම කේන්ද්‍රීය පාසලක් හඳුනාගැනීම හා ඒ වටා අනෙකුත් පාසල් ජාලගත කිරීම.

5.0 සෑම පාසලක් සම්බන්ධයෙන් ම වෙනම පාසල් ගොනුවක් (school profile) පවත්වා ගෙන යා යුතු ය. එම ගොනුවේ මෙම පාසල් තෝරා ගැනීම සම්බන්ධයෙන් සාධාරණීකරණ වාර්තා මෙන්ම අදාළ දත්ත හා තොරතුරු ඇතුළත් ව තිබිය යුතු ය.

6.0 ඒ ඒ පළාත් විසින් පාසල් හඳුනාගැනීමෙන් අනතුරුව ඊට අදාළ ව්‍යුහ යෝජනා ද සහිත ව, ආකෘති පත්‍ර 5 අනුව වාර්තාවක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

7.0 මෙම වැඩසටහන සම්බන්ධයෙන් යම්කිසි ප්‍රතිපත්තිමය ගැටළුවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වන අවසන් තීරණ ගැනීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

**එන්. එච්.එම්. චිත්‍රානන්ද**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

**පිටපත්:**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය
2. සභාපති, මුදල් කොමිෂන් සභාව
3. විගණකාධිපති
4. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
5. සියලුම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
7. කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
9. අධ්‍යක්ෂ ජනරාල් (මුදල්), අධ්‍යාපන අමාත්‍යාංශය
10. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
11. සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
12. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්), අධ්‍යාපන අමාත්‍යාංශය
13. අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්), අධ්‍යාපන අමාත්‍යාංශය
14. අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය

**Format No. 1:** **Student flow by student information (need to fill according to separate grades)**

| Name of the student | Grama Niladari Division | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | A | B | C | D | E | F | G.. | Other |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| . | | | | | | | | |
| . | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13 | | | | | | | | |
| Total | | | | | | | | |

**Format No. 2: Student flow by grades**

| Grade | No. of students by Grama Niladari Division | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | A | B | C | D | E | F | G.. | Other |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| . | | | | | | | | |
| . | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13 | | | | | | | | |
| Total | | | | | | | | |

**Format No. 3a:** **Student flow by schools (summary by GN division)**

| School | No. of students by Grama Niladari Division | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | A | B | C | D | E | F | G.. | Other |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| . | | | | | | | | |
| . | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13 | | | | | | | | |
| Total | | | | | | | | |

**Format No. 3b:** **Student flow by GN division (example)**

| School | No. of students by Grama Niladari Division | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | [illegible] | B | C | D | E | F | G | H | I | J | K | Other |
| L | **15** | **9** | **8** | **4** | **2** | 2 | 1 | 3 | -- | -- | -- | 02 |
| M | **7** | **10** | **6** | **5** | **--** | -- | 3 | 2 | 1 | -- | -- | 06 |
| N | **16** | **25** | **18** | **20** | **4** | 6 | 2 | 1 | -- | -- | -- | 03 |
| O | **8** | **10** | **25** | **30** | **10** | 2 | 4 | 1 | -- | 3 | 2 | 06 |
| P | **2** | **4** | **17** | **25** | **30** | 4 | 5 | 3 | 2 | -- | 1 | 07 |
| Q | 2 | 1 | 5 | 1 | 5 | **2** | **19** | **20** | **21** | **17** | **18** | 06 |
| R | -- | -- | 4 | 2 | 3 | **6** | **10** | **12** | **14** | **16** | **06** | 03 |
| S | 3 | 6 | 2 | 1 | 5 | **7** | **17** | **18** | **20** | **06** | **07** | 01 |
| T | -- | -- | 6 | 7 | 8 | **11** | **15** | **16** | **12** | **03** | **04** | 02 |
| U | 1 | 2 | 4 | 3 | 3 | **6** | **14** | **11** | **18** | **20** | **06** | 01 |

**Format No. 4:** **Student flow by school by grade**

| Schools of a selected Group | | No. of students by Grama Niladari Division | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| School | Cycle | A | B | C | D | E | F | G | Other |
| L | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| M | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| N | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| . | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| . | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| . | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |
| U | Gr 1-5 | | | | | | | | |
| | Gr 6-11 | | | | | | | | |
| | Gr 12-13 | | | | | | | | |

## Format No. 5: Format for submission of school list with structure proposals

Province :

Zone :

| SN | Proposed school network | SN | Core school of the school network | SN | Other schools/ feeder schools linked to the core school of the network | Present status | | | | | | Proposed structure | | | | | | | | Special remarks | Justification |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | No. of students | | | No. of teachers | | | Grade span | No. of students | | | No. of teachers | | | Proposed GCE AL stream | | |
| | | | | | | M | F | T | M | F | T | | M | F | T | M | F | T | | | |
| 1 | | 1 | | 1 | | | | | | | | | | | | | | | | | |
| | | | | 2 | | | | | | | | | | | | | | | | | |
| | | | | 3 | | | | | | | | | | | | | | | | | |
| | | | | 4 | | | | | | | | | | | | | | | | | |
| | | | | 5 | | | | | | | | | | | | | | | | | |
| | | | | 6 | | | | | | | | | | | | | | | | | |
| | | | | 7 | | | | | | | | | | | | | | | | | |
| | | | | 8 | | | | | | | | | | | | | | | | | |
| 2 | | 2 | | 1 | | | | | | | | | | | | | | | | | |
| | | | | 2 | | | | | | | | | | | | | | | | | |
| | | | | 3 | | | | | | | | | | | | | | | | | |
| | | | | 4 | | | | | | | | | | | | | | | | | |
| | | | | 5 | | | | | | | | | | | | | | | | | |
| | | | | 6 | | | | | | | | | | | | | | | | | |
| | | | | 7 | | | | | | | | | | | | | | | | | |
| | | | | 8 | | | | | | | | | | | | | | | | | |

I hereby certify the above information and data is true and correct.

Signature:...........................................

Name :..................................................

Designation: Provincial Director of Education (...................... Province)

Date:...............2020